**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - 2014**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 21 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් ලේඛන පරීක්ෂාවට අනුව පශ්චාත් උපාධි පාඨමාලා ආදායම රු. 17,841,675 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුනේ රු.14,394,809 ක් පමණක් වන අතර වියදම් ලේඛනවලට අදාලව සමාලෝචිත වර්ෂයට අදාල පශ්චාත් උපාධි පාඨමාලා වියදම රු.14,694,951 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණේ රු.10,743,085 ක් පමණි.

(ආ) සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණු දැනට භාවිතයේ පවතින පිරිවැය රු.73,712,879 ක් වූ ස්ථාවර වත්කම් සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් අපහරණයෙන් ලද අතිරික්තය වූ රු.3,018,939 ක් සහ අනෙකුත් වත්කම් අපහරණයෙන් ලද රු.3,024,439 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනම දක්වා නොතිබුණි.

(ඈ) එකතුව රු.623,475 ක් වටිනා භාවිතයට නොගන්නා ටෝනර්, රිබන් හා කාඩ්රිජ් තොගයක් සහ වර්ග 05 කට අයත් තොග ඒකක 103 ක වටිනාකම් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ ලැබී තිබූ ප්‍රාග්ධන ආධාර රු.42,805,432 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද උපයෝජනය කර නොතිබුණි. එම මුදල වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ආධාර වශයෙන් දක්වනවා වෙනුවට ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 28 දින ආධාර වශයෙන් ලැබී තිබූ රු.9,390,000 ක් වූ වාහනයක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණු බැවින්, ප්‍රාග්ධන ආධාර සහ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) මුදල් අයකරගත නොහැකි හෝ අයකර ගැනීම සැක සහිත රු.16,551,911 ක ණයගැතියන් වෙනුවෙන් ප්‍රමාණවත් බොල් හා අඩමාණ ණය ප්‍රතිපාදනයක් ඇති කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පශ්චාත් උපාධි පාඨමාලා වෙනුවෙන් ලැබිය යුතු පාඨමාලා ගාස්තු රු.1,260,000 කින් වැඩියෙන්ද ඉදිරියට ලැබූ පාඨමාලා ගාස්තු ආදායම රු.170,000 කින් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) ඉදිරි වර්ෂය සඳහා නේවාසිකාගාර කුලී ආදායම ලෙස සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.406,853 ක් කලින් ලද නේවාසිකාගාර කුලී ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ කුලී ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) අන්තර්ජාල වියදම් සඳහා වූ උපචිත වියදම් රු.602,040 ක් ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයට අදාල එම වියදම ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන පහත සඳහන් විෂයයන් සඳහා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග | 81,409,662 | විස්තරාත්මක උපලේඛණ |
| (ii) | සංචාරක නිවාසයේ අළුත්වැඩියා වියදම් | 723,005 | අදාල ගෙවීම් වවුචර් 2 ක් |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුළු එකතුව රු.84,469,651 ක් වූ ණයගැති ශේෂ වලින් රු.13,264,328 ක් වූ ශේෂ 21 ක් අවුරුදු 3 ක කාලයක් ඉක්මවූ ඒවා වූ අතර ඒ අතරින් රු.879,706 ක් වූ ශේෂ 10 ක් වර්ෂ 5 ක කාලයක්ද ඉක්මවා තිබුණි.

(ආ) එකතුව රු.112,525,180 ක ගෙවිය යුතු ශේෂ වලින් රු.3,034,228 ක් වූ ශේෂ 18 ක් වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබුණු අතර, රු.815,038 ක් වූ ශේෂ 9 ක් වර්ෂ 5 ක කාලයක්ද ඉක්මවා පැවතුණි.

(ඇ) එකතු වටිනාකම රු.18,813,314 ක් වූ ගෙවිය යුතු තැන්පත් ශේෂ වලින් රු.2,604,812 ක් වූ ශේෂ 14 ක් වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 13(1) වගන්තිය | පාලක සභාවේ රැස්වීම් යටත් පිරිසෙයින් සෑම මාසයකට එක් වරක්වත් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණේ රැස්වීම් 07 ක් පමණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

| | |
|---|---|
| (i) XII වැනි පරිච්ඡේදයේ 23.18 වගන්තිය | රජයේ නිලධාරීන් දිවයිනෙන් බැහැර ගත කරන නිවාඩු පිළිබඳ විස්තර මාසපතා විගණකාධිපති වෙත වාර්තා කළ යුතු වුවත්, පරීක්ෂණයට ලක් කළ නියැදියෙන් නිලධාරීන් 25 දෙනෙකුගේ නිවාඩු විස්තර ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) xv වන පරිච්ඡේදයේ 10 වන වගන්තිය හා 1996 අප්‍රේල් 20 දිනැති අංක එම්.එෆ්.6/1/1/96 දරන මුදල් හා ක්‍රම සම්පාදන චක්‍රලේඛයේ 2.1.8 ඡේදය | විදේශ ගමන් සඳහා දිවයිනෙන් බැහැර වීම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත්, පරීක්ෂා කරන ලද නියැදියෙන් නිලධාරීන් 14 දෙනෙකු එසේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (iii) xxiv වන පරිච්ඡේදයේ 10.4 වගන්තිය | වසර 10 ක ස්ථිර සේවා කාලයක් නොමැති නිලධාරීන් ආපදා ණය ඉල්ලුම් කිරීමේදී ණය අයදුම්පත සමඟ සේවා කාලය අවු.10 ට වැඩි ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි එක් ඇපකරුවකු හෝ අවු.05 ට නොඅඩු සේවා කාලයක් ඇති ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඇපකරුවන් ඉදිරිපත් නොකළ ණය අයදුම්පත් සඳහා ආපදා ණය ලබාදුන් අවස්ථා 10 ක් නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 155 | රෙගුලාසි ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ ආයතනය වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 09 කට 2015 අගෝස්තු 12 වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 188(2) | උපලබ්ධි නොවූ රු.164,725 ක්වූ චෙක්පත් 28 ක් 2007 වර්ෂයේ සිට පැවති අතර එම ශේෂයන් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 210(1) | ජල බිල්පත් නිරවුල් කිරීමේදී වට්ටම් වාසි ලබා ගැනීමට නියමිත දිනට ගෙවීම් නොකිරීම නිසා රු.27,819 ක වට්ටම් අහිමි වී තිබුණි. |

| | | |
|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි 396 (ඈ) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ක කාලයක් ඉක්ම වූ එකතු වටිනාකම රු.48,345 ක් වූ චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් අදාළ විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 757 (2) | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අතිරික්ත හා ඌනතා ඇති වුවහොත් ගණන් දීමේ නිළධාරියා විසින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 1645 (අ) | වාහන 16 කට අදාල ලොග් සටහන් පොත් විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විධිමත් පරිදි සකස් කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.34,195,260 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.32,251,344 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,943,916 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 3.2 විශ්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර දායකය හා ක්‍රමක්ෂය රු.35,089,019 කින් හා විවිධ ආදායම් රු.6,245,308 කින් වැඩිවී තිබුණද, කාර්යමණ්ඩල වැටුප් හා දීමනා රු.17,266,873 කින් වැඩි වීම හා විදේශ පුහුණුව හා අධ්‍යාපන චාරිකා සඳහා රු.26,306,553 ක් වැයකිරීම නිසා වියදම වැඩි වීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ අවසානයට රු.103,013,054 ක් වූ ජංගම වත්කම් සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.156,497,018 ක් දක්වා වැඩි වී තිබියදීත්, ජංගම බැරකම් පිළිවෙලින් රු.55,142,941 සිට රු.170,287,844 දක්වා වැඩිවී තිබු හෙයින්, සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ජංගම වත්කම් රු.61,660,939 කින් හෙවත් සියයට 129 කින් අඩුවී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ අවසානයට රු.38,271,421 ක් වූ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට රු.210,947 ක සෘණ අගයක් බවට පරිවර්තනය වී තිබූ හෙයින් රු.38,482,368 කින් හෙවත් සියයට 101 කින් පිරිහීමක් නිරීක්ෂණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**(අ) පුහුණු කටයුතු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයේ දී සහ සමාලෝචිත වර්ෂයේ දී පවත්වා නොතිබුණු සැලසුම්ගත සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව පිළිවෙලින් 14 ක් හා 33 ක් විය.

(ii) ඉකුත් වර්ෂ දෙක සහ සමාලෝචිත වර්ෂයේදී පාඨමාලාව සඳහා තෝරාගත් සංඛ්‍යාව සහ පාඨමාලා හැරයාම් සංඛ්‍යාව පිළිබඳ සාරාංශගත විස්තර පහත දැක්වේ.

| වර්ෂය | සහතික පත්‍ර පාඨමාලා | | | | | |
|---|---|---|---|---|---|---|
| | කළමනාකරණ | | කළමනාකරණ නොවන | | ඩිප්ලෝමා පාඨමාලාව | |
| | තෝරාගත් සංඛ්‍යාව | හැරගිය සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව | හැරගිය සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව | හැරගිය සංඛ්‍යාව |
| 2014 | 1,057 | 303 | 11,027 | 4,006 | 590 | 144 |
| 2013 | 816 | 211 | 3,200 | 847 | 511 | 135 |
| 2012 | 1,036 | 399 | - | - | 628 | 102 |

ඩිප්ලෝමා පාඨමාලාවෙහි, වාර්ෂිකව පාඨමාලා හැර යන සංඛ්‍යාවේ අඛණ්ඩ වර්ධනයක් දක්නට ලැබුණි. සහතික පත්‍ර පාඨමාලාව- කළමනාකරණ 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ පාඨමාලාව හැරයන සංඛ්‍යාවේ වැඩිවීමක් දක්නට ලැබුණු අතර සහතික පත්‍ර කළමනාකරණ නොවන පාඨමාලා වලද වැඩි වීමක් දක්නට ලැබුණි.

**(ආ) උපදේශකවරුන් දේශන පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2008 පෙබරවාරි 06 දිනැති අංක: පීඩී/අයිසී/01/2008 දරන ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ චක්‍රලේඛයේ හා 2012 ජූලි 17 දිනැති උපදෙස් පත්‍රිකාව ප්‍රකාර, අභ්‍යන්තර උපදේශකවරයෙකු මාසයකට සැලසුම්ගත පුහුණු වැඩසටහන්වල පැය 45 ක් දේශන පැවැත්විය යුතුය. කෙසේ වුව ද ඊට අනුකූලව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දී ආයතනයට උපදේශකවරුන් 21 දෙනෙකුගෙන් දේශන පැය 7,494 ක් අහිමි වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේ දී උපදේශකවරු 21 දෙනෙකුගෙන් අහිමි වී තිබුණු පැය ගණන 9,241 ක් වී තිබුණි.

(ii) ඉකුත් වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද එකදු උපදේශකවරයෙකු හෝ මාසයකට නියමිත සම්පූර්ණ දේශන පැය ගණන පවත්වා නොතිබුණි. තවද, වර්ෂයකට එක් උපදේශක්වරයෙකු පැය 540 ක දේශන පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ උපදේශකවරුන් සැලසුම්ගත පාඨමාලා සඳහා දේශන පැවැත්වීම පැය 12 සිට පැය 405 ක පරාසයක් තුල විහිදී තිබුණි.

(ඇ) **පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2004 සිට 2011 දක්වා වර්ෂ 08 ක් තුළ ලියාපදිංචි වූ මුළු අපේක්ෂකයින් සංඛ්‍යාව 807 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට පශ්චාත් උපාධි හෝ ඩිප්ලෝමා ලබා ගෙන තිබුණේ එයින් 344 දෙනෙකු පමණි. එය මුළු ලියාපදිංචි සංඛ්‍යාවෙන් සියයට 43 පමණක් විය. පාඨමාලාවල දේශනවලට අඛණ්ඩව සහභාගී වී පාඨමාලා අවසන් නොකර වෙනත් පාඨමාලාවලට මාරු වීම එසේ අඩු අගයක් ගැනීමට හේතු වූ බව නිරීක්ෂණය විය.

(ii) පශ්චාත් උපාධි අධ්‍යයන අංශයට අයත් මාර්ගෝපදේශ සංග්‍රහයේ 6 වන වගන්තියට අනුව උපරිම වශයෙන් මාස 48 ක් ඇතුළත පාඨමාලාව අවසන් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iii) ඉහත මාර්ගෝපදේශ සංග්‍රහයේ 19 වන වගන්තියට අනුව මාස 36 ක් ඇතුළත උපාධි නිබන්ධනය ඉදිරිපත් කළ යුතු වුවත්, උපාධි නිබන්ධන ඉදිරිපත් කිරීම අඛණ්ඩව ප්‍රමාද වී තිබුණි.

**4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ සාමාජිකයින්ට සහ අධ්‍යයන අංශවල උපදේශකවරුන්ට මෙන්ම පාඨමාලා හදාරන අයට 2000 සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ලබාදී තිබුණු පොත් 154 ක නියමිත කාලය අවසන් වී තිබියදීත් පුස්තකාලය වෙත භාරදී නොතිබුණු නමුත් ඒවා ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පශ්චාත් උපාධි පාඨමාලා හදාරන අයෙකු ලබාගෙන තිබූ පොතක් නියමිත දිනට භාර නොදීම නිසා රු.1,975 ක දඩයක් ගෙවිය යුතුව තිබුණද විගණිත දිනය වූ 2015 ජූලි 08 දින දක්වා එම මුදල අයකරගෙන නොතිබුණි.

(ඇ) නිල නිවාසවල පදිංචි නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2013 සහ 2014 වර්ෂවලට අදාලව අය විය යුතු රු.55,776 ක විදුලි බිල් අයකර ගැනීමට විගණිත දිනය වන 2015 ජූනි 30 දින වනවිටත් නොහැකි වී තිබුණි.

(ඈ) එකතුව රු.4,799,680 ක් වටිනා ලැප්ටොප් 32 ක් හා රු.16,640,640 ක් වටිනා ඩෙක්ස්ටොප් 162 ක් මිලදී ගැනීමේදී ආයතනයේ අවශ්‍යතාවය අනුව පිරිවිතර සකස් නොකිරීම නිසා මිල ගණන් කැඳවූ ආයතනවල මිලගණන් ප්‍රතික්ෂේප කර වෙනත් ආයතනයකින් මිලදී ගැනීම සිදුකර තිබුණි.

(ඉ) පවිත්‍රතා සේවා කටයුතු සඳහා බිල්පත් නිරවුල් කිරීමේදී සමාලෝචිත වර්ෂයේ නියමිත පරිදි සේවකයින් නොයෙදීම වෙනුවෙන් රු.1,590,873 ක්ද, ඉටු නොකළ වැඩ කොටස් වෙනුවෙන් රු.693,247 ක්ද අඩුකර බිල්පත් නිරවුල් කර තිබියදීත්, එම සේවා ආයතනයටම තවත් වසරක කාලයක් සඳහා පවිත්‍රතා කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේශන පැවැත්වීම සහ ඊට සම්බන්ධිත උපදේශක පාඨමාලා සම්බන්ධීකරණය, සැලසුම් කිරීම, මෘදුකාංග සංවර්ධනය වාර්තා ලිවීම යනාදී කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් ආයතනයේ ස්ථිර හා කොන්ත්‍රාත් උපදේශකරුවන්ට හා නිළධාරීන් කිහිපදෙනෙකුට සමාලෝචිත වර්ෂයේ දී රු.5,266,523 ක් ද, ඉකුත් වර්ෂයේ දී රු. 4,370,078 ක මුදලක් ද ගෙවා තිබුණි.

(ආ) නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්ට අයත් සංචාරක නිවාසය විධිමත් පරිදි පවරා නොගෙන එම සංචාරක නිවාසයේ අළුත්වැඩියාවන් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.3,575,248 ක් වැය කර තිබූ අතර එම වියදම ප්‍රාග්ධනිත කර වර්ෂයකට සියයට 2.5 බැගින් ක්ෂය කර තිබුණි.

(ඇ) ආයතනය විසින් ධාරිතා වර්ධන වැඩසටහන් 3 ක් සිදු කර තිබූ අතර එම වැඩසටහන් තුනෙන්, දෙකක් සඳහා රු.22,302,669 ක මුදලක් ආයතනයේ අරමුදල් වලින් වියදම් කර තිබුණද, ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාවිතයට නොගන්නා එකතු වටිනාකම රු.897,465 ක් වූ පරිගණක කාඩ්රිජ්, ටෝනර්, රිබන් යනාදී ලිපිද්‍රව්‍ය තොගයක් සහ ගොඩනැගිලි උපකරණ වර්ෂ ගණනාවක් තිස්සේ නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ ප්‍රධාන බැංකු(ජංගම) ගිණුම් දෙකෙහි මාසික වියදමේ අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා සැලකිය යුතු මුදල් ශේෂයන් රඳවා තිබුණු අතර, එම මුදල් ශේෂවල මාසික සාමාන්‍යය රු.52,496,622 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් වටිනාකම රු.2,568,000 ක් වූ ඩෙක්ස්ටොප් 25 ක්ද, රු.299,980 ක් වූ ලැප්ටොප් 2 ක්ද, රු.315,168 ක් වූ UPS 67 ක්ද විගණිත දිනය වූ 2015 ජුනි 06 දිනටත් ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1963 දෙසැම්බර් 12 දිනැති අංක 1024 එෆ්/800/29 සීඩී දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආයතනයට මූල්‍ය සහ පරිපාලන රෙගුලාසි සකස්කර ගත හැකි වුවද, එසේ සකස් කර නොගන්නේ නම් ඒ වෙනුවෙන් රජයේ මුදල් රෙගුලාසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතු වේ. එහෙත් වාර්ෂික නිවාඩු සහ අතිකාල දීමනා සම්බන්ධයෙන් සාප්පු හා කාර්යාල සේවකයින් පිළිබඳ ආඥා පනතේ විධිවිධාන අනුගමනය කර තිබුණ ද, රාජකාරි කාලය සහ කාර්යාල වේලාව සම්බන්ධයෙන් එම පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණි. මේ නිසා වාර්ෂිකව සැලකිය යුතු රාජකාරි පැය ගණනක් අහිමිවී තිබූ අතර, අතිකාල දීමනා වෙනුවෙන් ද වැඩිපුර ගෙවීම් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ධාරිතා වර්ධන වැඩසටහන්වලට සහභාගි වූ පුද්ගලයන් 109 දෙනෙකුට අවස්ථා 5 කදී ගාස්තු අයකිරීමකින් තොරව නේවාසික පහසුකම් ලබාදී තිබූ අතර ඒ සඳහා විධිමත් අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් අදියර II සහ III වශයෙන් මැලේසියාවේදී නොවැම්බර් මස 9 සිට 22 දක්වා හා දෙසැම්බර් 07 සිට 19 දක්වා පැවති ධාරිතා වර්ධන වැඩමුළු සඳහා

ආහාර, නවාතැන්, පාඨමාලා ගාස්තු යනාදිය වෙනුවෙන් ආයතනය විසින් රු.16,151,811 ක් නිලධාරීන් 63 දෙනෙකු වෙනුවෙන් අදාල ආයතනයට ගෙවා තිබුණද අංක මු/06/01/01/2010 හා 2010 ඔක්තෝබර් 11 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයට පටහැනිව සංයුක්ත දීමනා වශයෙන් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 500 බැගින් රු.4,181,750 ක් ගෙවා තිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියට බඳවා ගත් නිලධාරීන් 249 දෙනෙකු වෙනුවෙන් ක්ෂේත්‍රගත පුහුණුවක් වෙනුවෙන් ලබාදී තිබූ රු.1,992,000 ක අත්තිකාරම් මුදල රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලබා ගත යුතු වුවත්, එසේ නොකොට විධිමත් අනුමැතියක් රහිතව සමාලෝචිත වර්ෂයේදී කපා හැර තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

2014 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යමණ්ඩලය 162 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 125 ක් විය. මේ සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සේවක සංඛ්‍යා සැලැස්ම අනුව අනුමත තනතුරු 23 ක නිලධාරී පුරප්පාඩු 40 ක් පැවතුණු අතර එයින් තනතුරු 15 ක එක් නිලධාරියෙකු හෝ සේවයේ යොදවා නොතිබුණි.

(ආ) අනුමත නොවූ කළමනාකරණ සේවයේ අධි පන්තියේ නිලධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවා තිබුණු අතර වැඩසටහන් විශ්ලේෂක තනතුරට අනුමත වූ සංඛ්‍යාව ඉක්මවා එක් අයෙකු සේවයේ යොදවා තිබුණි.

**4.7 අනාර්ථික ගණුදෙනු**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක් නිසි පරිදි පවරා නොගෙන පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ ඒ වෙනුවෙන් විවිධ කාර්යයන් සඳහා රු.3,593,184 ක් වැය කර තිබුණි. විගණන දිනය වූ 2015 ජුනි 30 වන විට මෙම ව්‍යාපෘතිය අත්හැරීමට සිදුවී තිබුණු බැවින් මේ වෙනුවෙන් දරන ලද ඉහත මුදල අනාර්ථික වී තිබුණි.

**5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 2 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුනේ 2015 අප්‍රේල් 02 දීය.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) මාර්ගෝපදේශය අනුව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂයට අදාලව පමණක් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ අයවැයගත හා තථ්‍ය ආදායම් සියයට 38 සිට සියයට 86 දක්වාත්, අයවැයගත හා තථ්‍ය වියදම් සියයට 5 සිට සියයට 177 දක්වාත් වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2015 ජුනි 30 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයන් පිළිබඳ අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) මූල්‍ය පාලනය
(ආ) ස්ථාවර වත්කම් කළමනාකරණය
(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඈ) පාඨමාලා පැවැත්වීම සහ පුහුණු කටයුතු
(ඉ) වාහන උපයෝජනය
(ඊ) ණයගැතියෝ සහ ණයහිමියෝ
(උ) ගබඩා පාලනය